# 04 අවුරුදු උත්සවය



අන්න අන්න, රබන් සද්දේ...

අපි එතනට දුවමු.

- උඩ පල ගත්තත් වට්ටක්කා

  බිම පල ගත්තත් වට්ටක්කා

  උඩ පල ගත්තත් - බිම පල ගත්තත්

  පුංචි පුංචි ගෙඩි වට්ටක්කා

- උඩින් උඩින් වර පෙත්තප්පු

  බිමින් බිමින් වර පෙත්තප්පු

  උඩින් උඩින් වර - බිමින් බිමින් වර

  පිට්ටු කන්න වර පෙත්තප්පු

අර ආච්චි නට නටා රබන් ගහනවා

හරි ම ලස්සනයි.

එයා කවුද?

ඒ සිත්තිලාගේ ආච්චි.

සුරේෂ්, අර බලන්න

දිග පෝලිමක්.

ආ... එතන අලියාට ඇහැ තියනවා

අපිත් යමු, අලියාට ඇහැ තියන්න.

අන්න, තවත් **තරගයක්** ගැන කියනවා.

''මීළඟට කොට්ටා පොර **තරගය**

පටන් ගන්නවා.

චක්ගුඩු පැනීමේ **තරගය** හා

කඹ ඇදීමේ තරගයත්

ඉන් පසු පැවැත්වෙනවා.

ඒ සඳහා සහභාගි වන අය,

පිට්ටනියේ දකුණු පැත්තට පැමිණෙන්න.

**කණා** මුට්ටිය බිඳීමේ තරගයට සහභාගි වන අය,

ඒ සඳහා සූදානම් වෙන්න.''



සුරේෂ්, අර නංගිලා රවුමට ඉඳගෙන

පොල්කටුවකට මොනවා ද දමන්නේ?

ආ... ඒකට කියන්නේ පංච දමනවා කියලා.

ඒක පැරණි **ජන ක්‍රීඩාවක්.**

දීපාල්, අන්න කවුද නැන්දා කෙනෙක්

පොල් අත්තක් අරගෙන දුවනවා.

පොල් අතු වියන තරගයෙන් එයා පළමුවැනියා.

හැමෝම අත්පොඩි ගහනවා.

අපිත් අත්පොඩියක් ගහමු.

ලිස්සන ගහේ යන මාමා කොඩිය ළඟට ම නැඟලා.

කොඩිය ගන්න එයාගේ අත දිග මදි ඇති.

එයාගේ ඇඟේ මොනවා ද අර ගෑවිලා තියෙන්නේ?

ඒවා දිලිසෙනවා නේද?

ඒ ලිස්සන ගහේ ගාලා තියෙන ග්‍රීස් නේ...

ඒවා ගෑවුණා ම ලිස්සනවා.



අන්න, තවත් **තරගයක්** ගැන කියනවා.

මීළඟට පටන් ගන්නේ **ජන ගී** තරගය යි.

ඒ සඳහා සහභාගි වන අයගෙන්

**පළමුවැනි,** දෙවැනි හා **තුන්වැනි**

ස්ථානවලට වටිනා **තෑගි** දෙනවා.

කැමැති අයට **ජන නැටුම්**

ඉදිරිපත් කරන්නත් පුළුවන්.''



සුරේෂ්, මමත් **ජන ගීයක්** දන්නවා,

ඒක ගායනා කරන්න ද?

හොඳයි දීපාල්,

එහෙනම් ලස්සනට ගායනා කරන්න.

**වරම් වරම් ඉර හඳ දෙවි අතින් වරම්**

**වරම් ගතිමි මිහිකත් දෙවි අතින් වරම්**

**වරම් ගතිමි සක්වළ දෙවි අතින් වරම්**

**වරම් ගොයම් කැපුමට දෙවිඳුන්ගෙ වරම්**

# වචන මාලාව

| | |
|---|---|
| එයා කවුද | - அவர் யார் |
| තරග | - போட்டி |
| කණා මුට්ටිය | - முட்டி உடைத்தல் |
| ජන ක්‍රීඩාවක් | - கிராமிய விளையாட்டு |
| කවුද | - யார் |
| ලිස්සන ගහ | - வழுக்கு மரம் |
| මදි | - போதாது |
| ඇති | - போதும் |
| පළමුවැන | - முதலாம் |
| දෙවැනි | - இரண்டாம் |
| තුන්වෙනි | - மூன்றாம் |
| තෑගි | - பரிசு |
| ජන නැටුම් | - கிராமிய நடனம் |
| ජන ගී | - கிராமியப் பாடல் |

## ක්‍රියාකාරකම 01

**යා කරමු. කියවමු.**
**இணைப்போம், வாசிப்போம்.**



කොට්ටා පොරය



පංච දැමීම



කඹ ඇදීම



රබන් ගැසීම



ලිස්සන ගහේ නැගීම



කණා මුට්ටිය බිඳීම



පොල් අතු විවීම



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම 02

**ගළපමු. ලියමු. කියවමු.**
ஒழுங்குபடுத்துவோம், எழுதுவோம், வாசிப்போம்.

1. පද/ලස්සනයි/රබන්/හරි ම ..........................................................
2. දකුණු/පැමිණෙන්න/පිට්ටනියේ/පැත්තට ..................................
3. කියන්නේ/දමනවා/ඒකට/කියලා/පංච ......................................
4. තවත්/අන්න/කියනවා/තරගයක් ගැන..................................
5. ජන/දන්නවා/මමත්/ගීයක් ..........................................................

## ක්‍රියාකාරකම 03



**පිළිතුරු කියමු. ලියමු.**
விடை கூறுவோம், எழுதுவோம்.

1. උත්සවයේ නම කුමක් ද? ..........................................................
2. දිග පෝලිමක් තිබුණේ කුමකට ද? ......................................
3. නට නටා රබන් ගැසුවේ කවුද? ..........................................
4. නංගිලා රවුමට වාඩි වී කළේ කුමක් ද? ..............................
5. ලිස්සන ගහේ ගාලා තිබුණේ මොනවා ද? ..........................

## ක්‍රියාකාරකම 04

හිස්තැන් පුරවමු. කියවමු.
இடைவெளி நிரப்புவோம், வாசிப்போம்.

උදාහරණය:- **අවුරුදු උත්සවයේ ජන ක්‍රීඩා පැවැත්වෙනවා.**
**අවුරුදු උත්සවයේ ජන ක්‍රීඩා පැවැත්වුණා.**

1. අපි අවුරුදු උත්සවය බලනවා.

   අපි අවුරුදු උත්සවය ......................................

2. පළමුවැනියාට තෑගි දෙනවා.

   පළමුවැනියාට තෑගි ..........................................

3. මාමා ලිස්සන ගහේ නගිනවා.

   මාමා ලිස්සන ගහේ ..........................................

4. ජන ගී තරගය පටන් ගන්නවා.

   ජන ගී තරගය .....................................................

5. නංගිලා පංච දමනවා.

   නංගිලා පංච ........................................................

## ක්‍රියාකාරකම 05

අවුරුදු ක්‍රීඩාවල නම් ලියන්න.
புத்தாண்டு விளையாட்டுகளின் பெயர்களை எழுதுங்கள்.

1. .......................................................................................

2. .......................................................................................

3. .......................................................................................

4. .......................................................................................

5. .......................................................................................